# කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව
# முகாமைத்துவக் கணக்காய்வுத் திணைக்களம்
# DEPARTMENT OF MANAGEMENT AUDIT

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය, කොළඹ 01
நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சு, கொழும்பு 01
MINISTRY OF FINANCE, PLANNING ANd ECONOMIC DEVELOPMENT, Colombo 01

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No: DMA/ADM/07/CIRCULAR | ඔබේ අංකය / Your No / உமது இல: | දිනය / Date / திகதி: 2025.04.28 |

කළමනාකරණ විගණන චක්‍රලේඛ අංක: **DMA/01/2025**

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
දිස්ත්‍රික් ලේකම්වරුන්.

<u>අභ්‍යන්තර විගණන මාර්ගෝපදේශ</u>

කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද 2019.01.12 දිනැති අංක DMA/01-2019 දරණ කළමනාකරණ විගණන චක්‍රලේඛය, 2020.08.26 දිනැති පළාත් අභ්‍යන්තර විගණන මාර්ගෝපදේශ අංක 01 සහ ඊට පසුව එම චක්‍රලේඛවලට සිදු කරන ලද සංශෝධන හා අභ්‍යන්තර විගණන ක්‍රියාවලිය ශක්තිමත් කිරීම අරමුණු කරගෙන නිකුත් කළ විවිධ මාර්ගෝපදේශ සියල්ල සැලකිල්ලට ගෙන මෙම නව චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ. මෙහිදී ඉහත චක්‍රලේඛ හා මාර්ගෝපදේශවල ඇතුළත් ඇතැම් කරුණු සංශෝධනය කර ඇති අතර ඊට අමතරව විගණන හා කළමනාකරණ කමිටුවලදී නිරීක්ෂණය වූ අවධානය යොමු කළ යුතු නව ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් වන මගපෙන්වීම් ද ඇතුළත් කර ඇත. පළාත් සභා සහ පළාත් පාලන ආයතන සම්බන්ධයෙන් වන විට ඊට අදාළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන සහ අනෙකුත් ලිඛිත නීතිරීතිවලට යටත්ව මෙම චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන අනුගමනය කළ යුතු ය.

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 38 සහ 39 වන වගන්ති සහ මුදල් රෙගුලාසි (මු.රෙ) 127 සහ 128 (පළාත් සභා සම්බන්ධයෙන් වන විට පළාත් මූල්‍ය රීති) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්/ගණන්දීමේ නිලධාරීන් තම අමාත්‍යාංශය/ පළාත් සභාව/ දෙපාර්තමේන්තුව/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ඒවා යටතේ ඇති අනෙකුත් ආයතනවල මූල්‍ය කළමනාකරණය පිළිබඳ වගකීමට යටත් වේ. එමෙන්ම තම අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය/ ආයතනය/පළාත් සභාව හා පළාත් පාලන ආයතනය සම්බන්ධයෙන් රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාව/ පළාත් රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාව/ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව හමුවේ පෙනී සිටිය යුතු වේ.

මෙම වගකීම ඉටු කිරීමේ කාර්යයේ දී ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් සහ ගණන්දීමේ නිලධාරීන්හට භාණ්ඩාගාරයෙන් ලැබෙන සහාය තවදුරටත් ශක්තිමත් කිරීමේ අරමුණින් 2008.01.25 දිනැති අංක 08/0200/306/012 දරණ අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව භාණ්ඩාගාර දෙපාර්තමේන්තුවක් ලෙස 2008.02.01 දින සිට ස්ථාපනය කොට ඇත.

කාර්යාලය / அலுவலகம் / Office: 2484816, 2484500, 2484600, 2484700
අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் நாயகம் / Director General: 2484543
ෆැක්ස් / பெக்ஸ் / Fax: 2449496
වෙබ් අඩවිය / வெப் சைட் / website: www.treasury.gov.lk

ජාතික විගණන පනතේ 40(1) වගන්තිය ප්‍රකාරව පනතේ 41(2) හි සඳහන් විගණන ආස්ථිතයන් සඳහා අභ්‍යන්තර විගණකවරයෙකු පත්කළ යුතු ය. ඉහත ආස්ථිතයන්හි අභ්‍යන්තර විගණන කටයුතු කාර්යක්ෂමව හා ඵලදායිව සිදු කිරීමට අවශ්‍ය මග පෙන්වීම් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ඇත.

## 01. අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණනය යනු ආයතනික මෙහෙයුම් කටයුතුවලට වටිනාකම් එකතු කිරීම හා වැඩි දියුණු කිරීම සඳහා නිර්මාණය කර ඇති ස්වාධීන, අපක්ෂපාතී, විෂයානුබද්ධ සහතික වීම සහ උපදේශන ක්‍රියාකාරකම් වේ. එය කාර්යක්ෂම ආකාරයෙන් අවදානම් කළමනාකරණය, පාලනය හා පාලන ක්‍රියාවලින් ඇගයීම හා වැඩි දියුණු කිරීම සඳහා ක්‍රමානුකූල හා විනයානුකූල ප්‍රවේශයක් තුළින් ආයතනික අරමුණු මුදුන්පත් කර ගැනීමට මග පෙන්වයි.

### 1.1 අභ්‍යන්තර විගණන ප්‍රඥප්තිය

ආයතනයක අභ්‍යන්තර විගණනයේ අරමුණු, අධිකාරිය, වගකීම හා ආයතනයේ අභ්‍යන්තර විගණනයට හිමි ස්ථානය නිර්වචනය කරනු ලබන විධිමත් ලියවිල්ල අභ්‍යන්තර විගණන ප්‍රඥප්තිය ලෙස හැඳින්වේ. අභ්‍යන්තර විගණන ප්‍රඥප්තිය තුළ තවදුරටත් අභ්‍යන්තර විගණනයේ ස්වාධීනත්වය, වාර්තා කිරීම, ආචාර ධර්ම පද්ධතිය හා විෂය පථය පිළිබඳ විධිවිධාන ඇතුළත් වේ. සියලුම විගණන ආස්ථිතයන් සඳහා එකී ආස්ථිතයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක/ අභ්‍යන්තර විගණක විසින් අභ්‍යන්තර විගණන ප්‍රඥප්තිය සකස් කර අනුමත කරවා ගත යුතු ය.

### 1.2 අභ්‍යන්තර විගණනයේ ස්වාධීනත්වය

අභ්‍යන්තර විගණනයේ ස්වාධීනත්වය, පහත පනත් සහ රෙගුලාසි යටතේ තහවුරු කර ඇත.

i. 2024 අංක 44 දරණ රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 33(1) වගන්තිය
ii. 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(3) වගන්තිය
iii. මුදල් රෙගුලාසි සංග්‍රහයේ 134(1) රෙගුලාසිය

අභ්‍යන්තර විගණක සෘජුව ම ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාට/ ගණන්දීමේ නිලධාරියාට/ පාලක මණ්ඩලයට වාර්තා කිරීම මගින් වෙනත් පාර්ශ්වයන්ගේ බලපෑම් හෝ කොන්දේසිවලින් තොරව අපක්ෂපාතී, මධ්‍යස්ථ විනිශ්චයක් ලබා දීම සඳහා අවශ්‍ය වන විධිමත් කාර්යානුබද්ධ පැවැත්මක් උදෙසා පසුබිම නිර්මාණයකර ඇත. 2024 අංක 44 දරණ රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 33(1) උප වගන්තිය ප්‍රකාරව අභ්‍යන්තර විගණකවරයෙකු පත්කර ඇති රාජ්‍ය ආස්ථිතයක ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා, ගණන්දීමේ නිලධාරියා හෝ පාලක මණ්ඩලය විසින් අභ්‍යන්තර විගණකවරයා තම කර්තව්‍ය ස්වාධීනව ඉටුකරන බවටත්, ලබැඳියාවන් අතර ගැටුමක් ඇති විය හැකි ආකාරයේ කර්තව්‍ය අභ්‍යන්තර විගණකවරයාට නොපවරන බවටත් සහතික විය යුතු ය.

### 1.3 අභ්‍යන්තර විගණනයේ පරමාර්ථ සහ අරමුණු

අභ්‍යන්තර විගණනයේ පරමාර්ථය වන්නේ ආයතනයේ මෙහෙයුම් ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම හා එහි කාර්යසාධනය ඉහළ නංවා ගැනීම සඳහා සහාය වන්නා වූ කාර්යභාරයක් ඉටු කිරීමයි. එමෙන්ම අභ්‍යන්තර විගණනයේ අරමුණු වන්නේ,

i. නීතිරීති, රෙගුලාසි, ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටිවලට අනුගත වීම තහවුරු කිරීම
ii. වැරදි, වංචා සහ දූෂණ අනාවරණය හා වළක්වා ගැනීමට කටයුතු කිරීම
iii. අභ්‍යන්තර පාලන ක්‍රම ඇගයීම හා වැඩි දියුණු කිරීම
iv. වත්කම් අත්පත් කර ගැනීම, නිසි වාර්තා ගත කිරීම, භෞතික පැවැත්ම සහ ප්‍රතිපත්තිවලට අනුකූල වීම තහවුරු කිරීම මගින් වත්කම් ආරක්ෂා කිරීම

v. මූල්‍ය කළමනාකරණය/ මූල්‍ය විනය නිසි පරිදි පවත්වා ගෙන යාම
vi. පරිපූර්ණ ගිණුම්කරණ පද්ධතියක් සහතික කිරීම
vii. ආයතනයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් පිළිබඳ ස්වාධීන, අපක්ෂපාතී සහ විෂයානුබද්ධ සහතික කිරීම
(මු.රෙ 133(1) කෙරෙහි අවධානය යොමු කළ යුතු ය.)

**1.4 අභ්‍යන්තර විගණන විෂය පථය**

ආයතනයේ අභ්‍යන්තර විගණන ඒකකයේ විෂය පථය මු.රෙ 133(2) හි දක්වා ඇත. ඒ අනුව පහත කාර්යයන් සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරියාට හා ප්‍රගති/ අන්වේෂණ කමිටුවට සහාය වීම සඳහා මු.රෙ.133(2)(අ) සහ (ආ) වගන්ති යටතේ දක්වා ඇති කාර්යයන් අභ්‍යන්තර විගණන ඒකකයට පැවරේ.

i. දෙපාර්තමේන්තුවේ මුදල් කටයුතු පිළිබඳ පවත්නා අභ්‍යන්තර පාලන හා සෝදිසි ක්‍රමවල ප්‍රමාණාත්මකභාවය ඇගයීම.
ii. වැඩ යෝජනා ක්‍රම සහ ව්‍යාපෘතිවල ප්‍රගතිය සොයා බැලීම.

**1.5 අභ්‍යන්තර විගණකවරු පත්කිරීම**

ජාතික විගණන පනතේ 40(1) උප වගන්තිය අනුව පනතේ 41(2) උප වගන්තියෙහි සඳහන් සෑම විගණනය කරනු ලබන ආස්ථිත්‍යයන් සඳහා ම අභ්‍යන්තර විගණකවරයෙක් පත් කළ යුතු ය.

i. ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ/ ගණන්දීමේ නිලධාරියාගේ සෘජු අධීක්ෂණය යටතේ ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ Iපන්තියේ නිලධාරියෙකු ප්‍රධානත්වය දරණ අභ්‍යන්තර විගණන අංශයක් සියලුම අමාත්‍යාංශ, පළාත් සභා හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල සඳහා ස්ථාපිත කළ යුතු ය.
ii. වාර්ෂික අයවැය මගින් වෙන් කරන ප්‍රතිපාදන, කාර්ය මණ්ඩලය, ආයතනයේ විෂය පථය වැනි කරුණු සලකා බලා අවස්ථෝචිත පරිදි මධ්‍යම රජයේ දෙපාර්තමේන්තු/ විශේෂ වියදම් ඒකක සඳහා ද ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ I පන්තියේ නිලධාරියෙකු ප්‍රධානත්වය දරණ අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කළ යුතු ය.
iii. අනෙකුත් මධ්‍යම රජයේ දෙපාර්තමේන්තු/ විශේෂ වියදම් ඒකකයන්හි අභ්‍යන්තර විගණන ඒකකය ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ සුදුසු නිලධාරියෙකු යටතේ ස්ථාපිත විය යුතු ය.
iv. ජාතික විගණන පනතේ 40(1) වන වගන්තිය ප්‍රකාරව පනතේ 41(2) හි සඳහන් සෙසු ආයතන සම්බන්ධයෙන් සුදුසු විගණකවරයෙකු පත් කළ යුතු ය.

**02. විගණන හා කළමනාකරණ කමිටු**

**2.1 විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවීම, සංයුතිය, අරමුණු, කාර්යයන් සහ ගණපූරණය**

i. ජාතික විගණන පනතේ 41(1) ප්‍රකාරව 41(2) වන උප වගන්තියේ සඳහන් සෑම විගණනය කරනු ලබන ආස්ථිත්‍යයක් සඳහාම අදාළ ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා, ගණන්දීමේ නිලධාරියා හෝ අදාළ පාලක මණ්ඩලය විසින් තමාට සහායදීම පිණිස විගණන හා කළමනාකරණ කමිටුවක් පිහිටුවිය යුතු ය.
ii. ඒ ඒ ආයතනයන්ට අදාළ විගණන හා කළමනාකරණ කමිටුවල සංයුතිය ඇමුණුම 01 පරිදි විය යුතු ය.
iii. ජාතික විගණන පනතේ 41(1)(අ) සහ (ආ) උප වගන්ති ප්‍රකාරව කටයුතු සිදු කරන බවට තහවුරු කර ගැනීමට හැකි වන පරිදි සෑම අවස්ථාවකදීම අමාත්‍යාංශ ලේකම්වරයාගේ/ පළාත් ප්‍රධාන ලේකම්වරයාගේ/ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ/ දිස්ත්‍රික් ලේකම්වරයාගේ සහභාගීත්වයෙන් මෙම කමිටු පැවැත්වීම සිදු කළ යුතු ය.
(අ).විගණන හා කළමනාකරණ කමිටුවල කාර්යක්ෂම ක්‍රියාකාරීත්වය පිළිබඳ අමාත්‍යාංශ ලේකම්වරයාගේ/ පළාත් ප්‍රධාන ලේකම්වරයාගේ/ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ/ දිස්ත්‍රික් ලේකම්වරයාගේ පෞද්ගලික අවධානය යොමු කළ යුතු ය.

(ආ).විගණන හා කළමනාකරණ කමිටුවේදී තම ආයතනය පිළිබඳව ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ/ පළාත් අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂකගේ/ අභ්‍යන්තර විගණකගේ සහ විගණකාධිපතිගේ විගණන වාර්තා කෙරෙහි අවධානය යොමු කළ යුතු ය.

(ඇ).ප්‍රමාණවත් පාලන පද්ධතීන් හඳුන්වා දීමට අදාළ වන වැදගත් කළමනාකරණ කරුණු ද සාකච්ඡා කර පවතින ගැටලු සඳහා වහා ම නිවැරදි කිරීමේ හා වැළැක්වීමේ පිළියම් යෙදීම සිදු කළ යුතු ය. විගණන හා කළමනාකරණ කමිටු සඳහා නිර්දේශිත කාර්යභාරය **ඇමුණුම 02** හි සඳහන් කර ඇත. කමිටු නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිළිබඳ පසු විපරම් කටයුතු කිරීම පිණිස ක්‍රමවත්ව විගණන හා කළමනාකරණ කමිටු වාර්තා පවත්වා ගෙන යාම ද සිදු කළ යුතු ය.

iv. ඇමුණුම 01 හි සඳහන් විගණන කමිටු සාමාජිකයින්ගේ පූර්ණ සහභාගිත්වයෙන් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්විය යුතු ය. මෙහි දී කමිටු සභාපතිගේ සහභාගිත්වය අනිවාර්යය වේ. ඔහුට රැස්වීම පුරා තම දායකත්වය ලබා දීමට හැකි වන පරිදි වෙනත් රාජකාරි නොමැති පහසු දිනයක් ඔහුගේ පූර්ව එකඟත්වය ඇතිව අදාළ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම සඳහා යොදා ගත යුතු ය. කමිටු සභාපති නොවන සාමාජිකයෙකුට නොවැළැක්විය හැකි හේතුවක් මත පැමිණීමට නොහැකි වූ විට කමිටු සභාපති සහ තවත් එක් සාමාජිකයෙකුගේ සහභාගිත්වයෙන් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්විය හැකි ය.

v. මධ්‍යම රජයේ දෙපාර්තමේන්තුවල විගණන හා කළමනාකරණ කමිටුවලට කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකු පත්කර නොමැති අවස්ථාවල දී දෙපාර්තමේන්තු විගණන හා කළමනාකරණ කමිටු සංයුතිය **ඇමුණුම 01 හි 2.2** යටතේ දක්වා ඇත.

## 2.2 විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම

i. සෑම කාර්තුවක් තුළම එක් රැස්වීමක් වන පරිදි අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04 ක් ප්‍රවර්තන වර්ෂයට අදාළ ව පැවැත්විය යුතු ය. එහෙත් ආයතන ප්‍රධානියා ආදායම් ගණන් දීමේ නිලධාරියකු වන අවස්ථාවල ඉහතින් සඳහන් කරන ලද විගණන කමිටු රැස්වීම් 04 ට අමතරව ආදායම් සම්බන්ධ ගැටලු සාකච්ඡා කිරීම සඳහා අමතර විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් අවශ්‍යතාවය පරිදි පැවැත්විය හැකි ය.

ii. විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්වල දී සාකච්ඡා කරන යම්කිසි කරුණක් සම්බන්ධයෙන් අමතර පැහැදිලි කර ගැනීමක් හෝ විශේෂ කරුණු දැක්වීමක් අවශ්‍ය වන්නේ නම්, අදාළ කරුණ සාකච්ඡාවට ගන්නා අවස්ථාවේදී ම එය සිදු කිරීම වඩා ඵලදායී වන අතර එය කාලය කළමනාකරණය කර ගැනීම සඳහා ද උපකාරී වේ.

iii. විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්වල දී ගනු ලබන තීරණ කඩිනමින් ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ ආයතන ප්‍රධානීන් කමිටු රැස්වීමට අනිවාර්යයෙන් ම සහභාගී කරවා ගැනීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්ගේ හා ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීම වේ.

iv. කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ නියෝජිත අවශ්‍ය මග පෙන්වීම් සිදු කරනු ලබන අතර ඔහු/ඇය විසින් එම කමිටු රැස්වීම්වල දී නිරීක්ෂණය කරන ලද භාණ්ඩාගාර ලේකම්ගේ අවධානයට යොමු කිරීම සුදුසු යැයි තීරණය කරනු ලබන කරුණු කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් මඟින් භාණ්ඩාගාර ලේකම් වෙත වාර්තා කරනු ලබයි.

## 2.3 විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් න්‍යාය පත්‍රය

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 41(1)(අ) සහ (ආ) හි සඳහන් කාර්යයන් ද ආවරණය වන පරිදි විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේ දී, සාකච්ඡා කළ යුතු කරුණුවල අවදානම හා ආයතනයේ අරමුණු කෙරෙහි ඇති කරනු ලබන බලපෑම සැලකිල්ලට ගෙන ප්‍රමුඛතා පදනමක් මත න්‍යාය පත්‍රය සකස් කළ යුතු ය. එවැනි න්‍යාය පත්‍රයක ආදර්ශ ආකෘතියක් **ඇමුණුම 03** හි

දැක්වේ. ඒ අනුව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් න්‍යාය පත්‍රයක ඇතුළත් විය යුතු ප්‍රධාන කරුණු පහත දැක්වේ.

**i. විගණකාධිපති විගණන විමසුම් සහ අභ්‍යන්තර විගණන වාර්තාවලින් පැන නැඟුනු කරුණු සාකච්ඡා කිරීම**

(අ).මෙහිදී විශේෂයෙන් ම විගණකාධිපති වෙතින් ලැබෙන විගණන විමසුම් හා විගණන වාර්තා මෙන් ම අභ්‍යන්තර විගණන වාර්තා සාකච්ඡා කිරීම තුළින් ආයතනයේ අභ්‍යන්තර පාලන පද්ධතියේ නිරීක්ෂණය වන අඩුපාඩු අවබෝධ කර ගැනීමටත්, එම අඩුපාඩු නැවත ඇතිවීම වළක්වා ගැනීමටත් හැකි වේ.

(ආ).විගණන විමසුම් සඳහා පැහැදිලි කිරීම් විගණනයට ලබා දුන් පසුව එම පැහැදිලි කිරීම් පිළිබඳව විගණන අංශ සෑහීමට පත් නොවන අවස්ථාවල දී තවදුරටත් සාකච්ඡා කළ යුතු කරුණු සම්බන්ධයෙන් අදාළ විගණන අංශ වෙතින් විමසා සාකච්ඡා කිරීම සඳහා න්‍යාය පත්‍රයට ඇතුළත් කළ යුතු ය.

**ii. අමාත්‍යාංශය/පළාත් සභාව යටතේ පවතින ආයතනවලට අදාළ කරුණු සාකච්ඡා කිරීම**

(අ).අමාත්‍යාංශය හෝ පළාත් සභාව යටතේ පවතින ආයතනවල විගණන නිරීක්ෂණ අමාත්‍යාංශ/ පළාත් සභා විගණන හා කළමනාකරණ කමිටුවේ සාකච්ඡා කිරීමට පෙර අදාළ ආයතනයේ විගණන හා කළමනාකරණ කමිටුවේ සාකච්ඡා කර විසඳා ගැනීමට උපරිම වශයෙන් උත්සාහ කළ යුතු ය. ආයතන මට්ටමෙන් විසඳා ගත නොහැකි අමාත්‍යාංශ/ පළාත් සභා විගණන හා කළමනාකරණ කමිටුවේ මැදිහත්වීමක් අවශ්‍ය වන ගැටලු පමණක් අමාත්‍යාංශ/ පළාත් සභා විගණන හා කළමනාකරණ කමිටුවට ඉදිරිපත් කළ යුතු අතර එසේ යොමු කිරීමේ දී අදාළ ආයතනයේ විගණන හා කළමනාකරණ කමිටුව එම කරුණ සම්බන්ධයෙන් එළඹි තීරණය කුමක් ද යන්න සඳහන් කළ යුතු ය.

(ආ).මෙහි දී අමාත්‍යාංශය/ පළාත් සභාව යටතේ පවතින සෙසු ආයතනවල විගණන හා කළමනාකරණ කමිටුවල සාමාජිකයකු හෝ නිරීක්ෂකයකු ලෙස අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක/ පළාත් අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ, සහභාගි වන බැවින් එකී ආයතනවල සාකච්ඡා කළ කරුණු අතරින් අමාත්‍යාංශ/ පළාත් සභා විගණන හා කළමනාකරණ කමිටුවේදී සාකච්ඡා කළ යුතු කරුණු ඇත්නම් එකී කරුණු ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ/ පළාත් අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂගේ නිර්දේශ සමග අමාත්‍යාංශ/ පළාත් සභා විගණන හා කළමනාකරණ කමිටුවට ඉදිරිපත් කළ යුතු ය. ඒ තුළින් අමාත්‍යාංශය යටතේ පවතින ආයතනවලට අදාළව අමාත්‍යාංශ/ පළාත් සභා විගණන හා කළමනාකරණ කමිටුවේ අත්‍යවශ්‍යයෙන් ම සාකච්ඡාවට භාජනය කළ යුතු කරුණු පමණක් සාකච්ඡා කරන බැවින් අමාත්‍යාංශයට/පළාත් සභාවට අදාළ කරුණු සඳහා මෙන් ම දෙපාර්තමේන්තු හා ආයතනවලින් ඉදිරිපත් කරන විශේෂිත කරුණු කෙරෙහි වැඩි අවධානයක් යොමු කර එම ගැටලු සඳහා නිසි විසඳුම් හා ක්‍රියා මාර්ග ගැනීමට වැඩි ඉඩකඩක් ලැබෙනු ඇත.

(ඇ).විගණන නිරීක්ෂණයන් විගණන හා කළමනාකරණ කමිටුවේ සාකච්ඡාවට ඉදිරිපත් කරන විට කමිටු සාමාජිකයින්ට හා නිරීක්ෂකයින්ට අවබෝධ කර ගත හැකි පරිදි විගණකයින් විසින් පෙන්වා දී ඇති ගැටලුව හෝ ගැටලු පිළිබඳ ප්‍රමාණවත් සාරාංශ විස්තරයක් සාකච්ඡා සටහන්වලට ඇතුළත් කළ යුතු ය.

iii. කාරක සභා මගින් ලබා දුන් නියෝග ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සාකච්ඡා කිරීම

රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාව/ පළාත් රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාව/ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව ලබා දුන් නියෝග පිළිබඳ සාකච්ඡා කරන විට අදාළ කාරක සභාව ලබා දුන් නියෝගය කුමක් ද යන්න සාකච්ඡා සටහන්වලට ඇතුළත් කළ යුතු ය.

## 2.4. විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර්තාව සකස් කිරීම, බෙදාහැරීම සහ ප්‍රගතිය වාර්තා කිරීම

### i. විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර්තාව සකස් කිරීම හා බෙදාහැරීම

(අ) විගණන හා කළමනාකරණ කමිටු නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිළිබඳ පසු විපරම කිරීමටත්,
(ආ) විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදී ගනු ලබන තීරණ ඒ ඒ නිළධාරීන් වෙත සන්නිවේදනය කිරීමටත්,
(ඇ) ඊළඟ රැස්වීමේ දී ප්‍රගතිය පරීක්ෂා කර බැලීමටත් හැකිවන ආකාරයට රැස්වීම් වාර්තා සකස් කළ යුතු ය.
(ඈ) රැස්වීම් වාර්තාවේ පිටපත් ජාතික විගණන කාර්යාලයට, කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට සහ රැස්වීමට සහභාගී වන ආයතන ප්‍රධානීන්ට හා අංශ ප්‍රධානීන්ට රැස්වීම පවත්වා සති 02 ක් තුළ යැවිය යුතු ය.

විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර්තාවක ආදර්ශ ආකෘතිය **ඇමුණුම - 04** හි දැක් වේ.

### ii. විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේ ප්‍රගතිය වාර්තා කිරීම

(අ) එළඹෙන විගණන හා කළමනාකරණ කමිටුව පැවැත්වීමට සති 02 කට පෙර කමිටු වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය ලිඛිතව ලබා ගත යුතු අතර විගණන හා කළමනාකරණ කමිටුව විසින් **2.5** හි සඳහන් අනු කමිටුව වෙත පවරන ලද කරුණු සම්බන්ධයෙන් එම කමිටුවේ නිර්දේශද සහිතව ප්‍රගතිය ප්‍රධාන අභ්‍යන්තර විගණක/ අභ්‍යන්තර විගණක විසින් ලබා ගත යුතු ය.
(ආ) එම ප්‍රගතිය විගණන හා කළමනාකරණ කමිටුව පැවැත්වෙන දිනට සතියකට පෙර විගණන හා කළමනාකරණ කමිටු සාමාජිකයන් වෙත ලබා දිය යුතු ය.
(ඇ) මෙහිදී ප්‍රගතිය ලබා දෙන දිනයත් විගණන කමිටුව පැවැත්වෙන දිනයත් අතර කාලයේ දී අත්කර ගන්නා ප්‍රගතිය කමිටු රැස්වීමේ දී වාචිකව හෝ වෙනත් සුදුසු ආකාරයකට වාර්තා කළ යුතු ය.

## 2.5. අනු කමිටුවක් පත්කිරීම

විගණන හා කළමනාකරණ කමිටුව විසින් වර්ෂය ආරම්භයේදී තම ආයතනයට අදාළව සාමාජිකයින් තිදෙනෙකුගෙන් සමන්විත ස්ථාවර අනු කමිටුවක් පත් කළ යුතු ය. මෙම අනු කමිටුව පිහිටුවීමේ ප්‍රධාන අරමුණ වනුයේ විගණන හා කළමනාකරණ කමිටුව විසින් එම අනු කමිටුවට යොමු කළ යුතු යැයි තීරණය කරනු ලබන කරුණු සම්බන්ධයෙන් අදාළ පාර්ශ්වයන් සමග සම්බන්ධීකරණය සිදුකර විගණන හා කළමනාකරණ කමිටුව වෙත නිරීක්ෂණ හා නිර්දේශ ලබාදීමයි. අදාළ කාරණයන්හි විෂය ස්වභාවය අනුව අවස්ථෝචිත පරිදි අදාළ විෂයේ ප්‍රාමාණික දැනුමක් සහිත සාමාජිකයින්ද එම අනු කමිටුවට නම් කළ

හැකිය. මෙම ක්‍රියාවලිය තුළින් විගණන හා කළමනාකරණ කමිටුවේ කාර්යභාරය වඩාත් කාර්යක්ෂම වන අතර කාලය කළමනාකරණය කර ගනිමින් ඵලදායි තීරණ ගැනීම සඳහා එය උපකාරී වේ.

එම අනු කමිටුව අමාත්‍යාංශයේ/ පළාත් සභාවේ/ දෙපාර්තමේන්තුවේ/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ, අතිරේක ලේකම්/ නියෝජ්‍ය ප්‍රධාන ලේකම්/ ප්‍රධාන මූල්‍ය නිලධාරී වැනි ජ්‍යෙෂ්ඨ මට්ටමේ මාණ්ඩලික නිලධාරීන්ගෙන් සමන්විත විය යුතු අතර එහි සංයුතිය අදාළ විගණන හා කළමනාකරණ කමිටුව විසින් තීරණය කළ යුතු ය. අදාළ ආයතනයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක/ පළාත් අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ/ අභ්‍යන්තර විගණක මෙම අනු කමිටුවේ කටයුතු සම්බන්ධීකරණය කළ යුතු ය.

## 2.6. විගණන හා කළමනාකරණ කමිටුව විසින් අවසන් එකඟතාවයකට එළඹී කමිටු තීරණවල ප්‍රගතිය වාර්තා කිරීම

විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්වල දී කමිටුව විසින් අවසන් එකඟතාවයකට එළඹෙන ලද කමිටු තීරණ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය ඇමුණුම 05-i සිට 05-iii දක්වා වූ ආකෘති මගින් පහත දක්වා ඇති පරිදි වාර්තා කළ යුතු ය.

**i. නෛතික කටයුතුවලට යොමුවන කරුණු.**

(අ) නීතිපති උපදෙස් ලබා ගෙන අධිකරණ ක්‍රියා මාර්ග ආරම්භ කර ඇති ගැටලු සම්බන්ධයෙන් එලෙස අධිකරණ ක්‍රියා මාර්ග අවසන් වන තෙක් අදාළ ගැටලුව විගණන හා කළමනාකරණ කමිටුවල දී සාකච්ඡා කිරීම තාවකාලිකව නතර කළ හැකි අතර එවැනි කරුණු ප්‍රධාන අභ්‍යන්තර විගණක විසින් **ඇමුණුම 05-i** ආකෘතියට අනුව වාර්තා කළ යුතු ය. එලෙස වාර්තා කළ යම් ගැටලුවක් සම්බන්ධයෙන් අධිකරණ තීන්දුවක් ලැබුණු විගස එම කරුණ හා ඊට සම්බන්ධ අධිකරණ තීරණය එළඹෙන ආසන්න ම විගණන හා කළමනාකරණ කමිටුව වෙත ඉදිරිපත් කර ඒ සම්බන්ධයෙන් කමිටු නිර්දේශ ලබා ගෙන ඒ අනුව ඉදිරි කටයුතු සිදු කළ යුතු ය.

(ආ) එලෙස අධිකරණ තීරණයන් නොලැබුණ කරුණු සම්බන්ධයෙන් එම අධිකරණ ක්‍රියා මාර්ගවල වර්තමාන ප්‍රගතිය සඳහන් කර ප්‍රධාන අභ්‍යන්තර විගණක/පළාත් අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ/ අභ්‍යන්තර විගණක විසින් වර්ෂය අවසානයේ පවත් වන විගණන හා කළමනාකරණ කමිටුවට වාර්තා කළ යුතු ය. අධිකරණ තීරණ ලැබෙන තෙක් මෙම පියවර වාර්ෂිකව අනුගමනය කළ යුතු ය.

(ඇ) එමෙන්ම විගණන කමිටුව විසින් තාවකාලිකව සාකච්ඡාවෙන් ඉවත් කරන ලද යම්කිසි අධිකරණ ක්‍රියා මාර්ග ගෙන ඇති කරුණක් සම්බන්ධයෙන් වර්ෂ අවසානය වන තෙක් නො සිට එම කරුණ නැවත කමිටුවේ සාකච්ඡාවට ගත යුතු යැයි කමිටු සාමාජිකයින් අදහස් කරන අවස්ථාවල දී එම කරුණ නැවත න්‍යාය පත්‍රයට ඇතුළත් කළ හැකි ය.

**ii. විගණකාධිපතිගේ නියෝජිත, බලධාරීන් හෝ ආයතන විසින් එකඟ නොවන කරුණු.**

(අ) යම්කිසි විගණන නිරීක්ෂණයක් හෝ ගැටලුවක් සම්බන්ධයෙන් ඊට අදාළ සියලු ම කරුණු සැලකිල්ලට ගෙන අවසාන වශයෙන් ගත හැකි ක්‍රියා මාර්ග පිළිබඳව කමිටුව විසින් අවසන් එකඟතාවයකට එළඹුණු පසුවත් එම තීරණ සම්බන්ධයෙන් විගණකාධිපතිගේ නියෝජිත, අදාළ බලධාරීන් හෝ ආයතන (උදා:- පාඩු හානි කපා හැරීමක දී මහා භාණ්ඩාගාරය/ පළාත් භාණ්ඩාගාරය) එම කමිටු තීරණය හා එකඟ නොවන අවස්ථාවල දී එම කරුණ තවදුරටත් විගණන හා කළමනාකරණ කමිටුවේ සාකච්ඡා කිරීම අනවශ්‍ය ලෙස කාලය වැය වන නිෂ්ඵල කාර්යයකි.

(ආ) එබැවින් කමිටුවේ අවධානය යොමු විය යුතු වෙනත් කරුණු සඳහා කාලය කළමනාකරණය කර ගැනීමේ අරමුණින් එම කරුණ විගණන හා කළමනාකරණ කමිටු න්‍යාය පත්‍රයෙන් ඉවත්කර අවසන් කමිටු තීරණය රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක

සභාවේ/ පළාත් ගිණුම් පිළිබඳ කාරක සභාවේ/ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ අවධානයට කාරක සභා අවස්ථාවේ දී යොමු කළ යුතු ය.

(ඇ) මෙහි දී එම කමිටු තීරණය ලබා ගැනීම සඳහා පදනම් වූ සියලු ම තොරතුරු ඇතුළත් වූ ගොනුවක් අභ්‍යන්තර විගණක විසින් නඩත්තු කළ යුතු අතර **ඇමුණුම 05-ii** ආකෘති පත්‍රයට ද එකී තොරතුරු ඇතුළත් කළ යුතු ය. එම කමිටු තීරණ සම්බන්ධයෙන් රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාව/ පළාත් රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාව/ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් ලබා දෙන තීරණ අනුව අවශ්‍ය ඉදිරි ක්‍රියා මාර්ග ගත යුතු ය.

**iii.** **විගණන හා කළමනාකරණ කමිටු සාමාජිකයින්ගේ හා නිරීක්ෂකයින්ගේ එකඟතාවයෙන් එළඹෙන තීරණ**

(අ) විගණන හා කළමනාකරණ කමිටුවේ සාමාජිකයන්ගේ සහ ජාතික විගණන කාර්යාලයේ නිරීක්ෂකගේ එකඟතාවයෙන් එළඹෙන තීරණ ක්‍රියාත්මක කිරීමේ වගකීම ආයතන ප්‍රධානියාට පැවරේ.

(ආ) එම කරුණු එළඹෙන සෑම විගණන හා කළමනාකරණ කමිටුවකදී ම නැවත නැවත සාකච්ඡා කිරීම අවශ්‍ය නොවන අතර විගණන හා කළමනාකරණ කමිටුව විසින් ප්‍රගතිය ලබා දෙන ලෙස දැනුම් දෙන කාර්තුවක දී හෝ වර්ෂයේ අවසන් විගණන හා කළමනාකරණ කමිටුවට අභ්‍යන්තර විගණක විසින් **ඇමුණුම 05-iii** අනුව ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය වාර්තා කළ යුතු ය.

(ඇ) විගණන හා කළමනාකරණ කමිටුව විසින් එලෙස දෙන ලද තීරණය අනුව සම්පූර්ණයෙන් ම ක්‍රියාත්මක කර අවසන් කරුණු ඊළඟ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේ සිට සාකච්ඡාවෙන් ඉවත් කිරීමට කමිටුවට බලය ඇත.

(ඈ) ඉහත (ආ) පරිදි නිශ්චිත කාර්තුවකදී ප්‍රගතිය වාර්තා කරන ලෙස දන්වා ඇති අවස්ථාවක කමිටුව විසින් ලබා දුන් තීරණ සම්බන්ධයෙන් කමිටුවේ අවධානය නැවත යොමු කළ යුතු යැයි අදහස් කරන අවස්ථාවක දී, ප්‍රගතිය වාර්තා කරන ලෙස නියම කර ඇති කාර්තුව එළඹෙන තෙක් නොසිට එම කරුණ ආසන්නතම විගණන හා කළමනාකරණ කමිටුවට ඉදිරිපත් කර ඒ පිළිබඳ තීරණයක් ලබා ගත යුතු ය.

**2.7.** වෙනත් කරුණු

i. විගණන හා කළමනාකරණ කමිටු සාමාජිකයින් වෙන් වෙන් ව හඳුනා ගත හැකි වන පරිදි සභාපතිවරයාට ආසන්නයේ කමිටු සාමාජිකයින්, නිරීක්ෂකයන් සහ කමිටු කැඳවුම්කරු වෙනුවෙන් ආසන පිළියෙල කිරීම හා නාම පුවරු සකස් කර තැබීම මගින් රැස්වීමේ කටයුතු වඩාත් විධිමත් කර ගැනීමට හැකි වේ. සෙසු නිලධාරීන් සඳහා සුදුසු පරිදි ආසන පිළියෙල කළ යුතු ය.

ii. තව ද අමාත්‍යාංශයේ/පළාත් සභාවේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීමට ප්‍රථම අමාත්‍යාංශය/ පළාත් සභාව යටතේ ඇති අනෙකුත් සියලු ම ආයතනවල විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා අවසන් කළ යුතු ය.

## **03.** වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම

### **3.1.** වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම පිළියෙල කිරීම

වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම යනු ඉදිරි වර්ෂයේ විගණන ක්‍රියාකාරකම්වල විෂය පථය, අරමුණු සහ විගණන ක්‍රියාකාරකම්වල කාල සටහන ඇතුළත් උපාය මාර්ගික සැලැස්මකි. එය ආයතනයේ අවදානම් කළමනාකරණය, පාලනය සහ ආයතනික පරිපාලන ක්‍රියාකාරකම් ඇගයීමට අවශ්‍ය මගපෙන්වීමක් ලෙස කටයුතු කරයි. මෙම සැලැස්ම මගින් ආයතනයේ අරමුණු සමග ගැළපෙන පරිදි අවදානම් පාදක කර ගත් ප්‍රමුඛතා පදනමක් මත විගණන ක්ෂේත්‍ර තීරණය

කරනු ලබයි. මෙම විගණන සැලැස්ම, අවදානම් ඇගයීම සහ පාර්ශ්වකරුවන් සමග සිදු කරන සාකච්ඡා මත තීරණය කර ආයතනයේ කාර්යසාධනය සහ අනුකූලතාව වැඩි දියුණු කිරීමේ අරමුණින් සකස් කරනු ලැබේ. මෙම වාර්ෂික විගණන සැලැස්ම යටතේ මූල්‍ය විගණනය, අනුකූලතා විගණනය, කාර්යසාධන විගණනය, පද්ධති විගණනය වැනි විගණන ක්ෂේත්‍ර ආවරණය විය යුතු ය.

මෙම විගණන සැලැස්ම අවදානම් පාදක විගණන සැලැස්මක් වන බැවින් එය පිළියෙල කිරීමේදී ඒ සඳහා කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ අංක DMA/1-2024 හා 2024.06.21 දිනැති කළමනාකරණ විගණන චක්‍රලේඛයේ පරිශිෂ්ඨ 3 අනුව ආයතනය විසින් පිළියෙල කරනු ලබන අවදානම් ලේඛනය උපයෝගී කර ගත යුතු ය. ඒ අනුව අතිශයින් ඉහළ සහ ඉහළ අවදානමක් සහිත ක්‍රියාකාරකම් සඳහා වැඩි ප්‍රමුඛතාවයක් ලබා දී එම අංශ විගණන සැලැස්මට ඇතුළත් කළ යුතු අතර පවතින මානව හා භෞතික සම්පත්වලට අනුකූලව මධ්‍යම හා පහළ අවදානමක් ඇති ක්‍රියාකාරකම් ද විගණන සැලැස්මට ඇතුළත් කළ හැකි ය.

අභ්‍යන්තර විගණක විසින් ආයතනයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් සිදු කරනු ලබන කාලීන තක්සේරු කිරීම්වල දී ආයතනය විසින් පහළ හෝ මධ්‍යම අවදානමක් ලෙස හඳුනා ගෙන ඇති ක්‍රියාකාරකම්වලට අදාළ පාලන ක්‍රමවල අතිශයින් ඉහළ හෝ ඉහළ අවදානමක් නිරීක්ෂණය වුවහොත් ඊට අනුරූපව සහ ආයතනය විසින් තම අවදානම් ලේඛනයට සිදු කරනු ලබන සංශෝධනයන් ද සැලකිල්ලට ගෙන අභ්‍යන්තර විගණක විසින් තම අවදානම් පාදක අභ්‍යන්තර විගණන සැලැස්ම සංශෝධනය කළ යුතු ය. වාර්ෂික අවදානම් පාදක අභ්‍යන්තර විගණන සැලැස්මට අදාළ ආදර්ශ ආකෘතිය **ඇමුණුම 06** හි දැක් වේ.
ඉදිරි වර්ෂය සඳහා වූ වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම පවත්නා වර්ෂයේ දෙසැම්බර් මස 15 දිනට පෙර සකස් කර ජාතික විගණන කාර්යාලයේ එකඟතාවය සහිතව විගණන හා කළමනාකරණ කමිටුවේ අනුමැතිය ලබා ගත යුතු ය. අනුමත කරන ලද වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්මෙහි පිටපත් ජාතික විගණන කාර්යාලයට සහ කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට යොමු කළ යුතු ය.

### 3.2 වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම ක්‍රියාත්මක කිරීම

වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම ක්‍රියාත්මක කිරීම ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ/ පළාත් අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂගේ/ අභ්‍යන්තර විගණකගේ වගකීමක් වේ. කෙසේ වෙතත් යම්කිසි පාලනය කළ නො හැකි හේතුවක් මත අභ්‍යන්තර විගණන සැලැස්ම නිසි පරිදි ක්‍රියාත්මක කළ නොහැකි අවස්ථාවක් ඇති වුවහොත් ඒ සඳහා සංශෝධිත අභ්‍යන්තර විගණන සැලැස්මක් සකස් කර එය අනුමත කර ගත යුතු ය.

## 04. අභ්‍යන්තර විගණන වැඩසටහන් සකස් කිරීම

අභ්‍යන්තර විගණන වැඩ සටහනක් යනු ආයතනයක් තුළ අභ්‍යන්තර විගණනයන් පැවැත්වීම සඳහා එහි විෂය පථය, අරමුණු, ක්‍රියාවලි සහ කාල නියමයන් ගෙන හැර දක්වන විස්තීරණ සැලැස්මකි. එය අභ්‍යන්තර විගණකවරුන් සඳහා සංවිධානයේ මෙහෙයුම් සහ පාලන ක්‍රමවල සඵලතාවය, කාර්යක්ෂමතාවය, අනුකූලතාවය සහ අවදානම් කළමනාකරණය ක්‍රමානුකූලව ඇගයීමට සහ සහතික කිරීමට මගපෙන්වීමක් ලෙස කටයුතු කරයි. අභ්‍යන්තර විගණන වැඩසටහනට අදාළ ආදර්ශ ආකෘතිය **ඇමුණුම 07** හි දැක් වේ.

## 05. අභ්‍යන්තර විගණන අංශ සඳහා සම්පත් වෙන් කිරීම සහ කාර්ය මණ්ඩල පුහුණුව

අභ්‍යන්තර විගණන ඒකකයන් සඳහා විගණන සැලැස්ම ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ප්‍රමාණවත් මානව සම්පත් සහ අනෙකුත් සම්පත් ලබා දීම ආයතන ප්‍රධානියාගේ වගකීම වේ. අභ්‍යන්තර

විගණන ඒකකයන් සඳහා විගණන කාර්ය මණ්ඩලය ලබා දීමේ දී හැකි සෑම විටම ගිණුම් හා විගණන විෂය පිළිබඳ දැනුම ඇති නිලධාරීන් ලබා දීම පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්ගේ සහ ගණන්දීමේ නිලධාරීන්ගේ විශේෂ අවධානය යොමු කළ යුතු ය. ඒ තුළින් අභ්‍යන්තර විගණන ඒකකයන්හි කාර්ය සාධනය ඉහළ නංවා ගැනීමට හැකි ය.

**06.** **අභ්‍යන්තර විගණක විසින් තම ආයතනයට අදාළව සකස් කර ඉදිරිපත් කළ යුතු වාර්තා**

**i.** මූලික වාර්තාව

සෑම වර්ෂයක් ආරම්භයේදී ම ආයතනයේ මෙහෙයුම් කටයුතු විධිමත්ව පවත්වා ගෙන යාම සඳහා සකස් කළ යුතු සැලසුම්, ආරම්භ කළ යුතු හා යාවත්කාලීන කළ යුතු පොත්පත්, ලේඛන හා ඒ හා සම්බන්ධ වන අභ්‍යන්තර පාලන ක්‍රමවේද ක්‍රියාත්මක කිරීමට අදාළ තොරතුරු ඇතුළත් කර මෙම චක්‍රලේඛයේ **ඇමුණුම 08** හි දැක්වෙන ආකෘතිය ප්‍රකාර මූලික වාර්තාවක් ප්‍රධාන අභ්‍යන්තර විගණකවරුන්/ පළාත් අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂවරුන්/ අභ්‍යන්තර විගණකවරුන් සෑම වර්ෂයක් සඳහා ම පිළියෙල කර අදාළ වර්ෂයේ ජනවාරි 31 දිනට ප්‍රථම තම ආයතන ප්‍රධානියා වෙත සහ එහි මෘදු පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව වෙත සහ විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය. එම මූලික වාර්තාව මගින් හඳුනාගනු ලැබූ බැහැරවීම් සම්බන්ධයෙන් වර්ෂයේ පළමු කාර්තුවේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේ දී සාකච්ඡා කර එකී බැහැරවීම් මගහරවා ගැනීමට ක්‍රියා කළ යුතු ය.

**ii.** අභ්‍යන්තර විගණන වාර්තා

සෑම අභ්‍යන්තර විගණන ඒකකයක් විසින් ම තම ආයතනයේ අවදානම් ලේඛණය පදනම් කරගෙන අවදානම් පාදක අභ්‍යන්තර විගණන සැලැස්මට අනුව සිදු කරනු ලබන විගණන පරීක්ෂණවලින් අනාවරණය කර ගත් කරුණු හා ඒ සම්බන්ධ නිරීක්ෂණ හා නිර්දේශයන් ඇතුළත් අභ්‍යන්තර විගණන වාර්තා අභ්‍යන්තර විගණක විසින් අත්සන් කර තම ආයතන ප්‍රධානියා වෙත ඉදිරිපත් කළ යුතු ය. අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනයක් සෑම අභ්‍යන්තර විගණන ඒකකයක් විසින් ම පවත්වා ගත යුතු ය. තව ද 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය අනුව කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව වෙත සහ මු.රෙ 134(3) පරිදි ජාතික විගණන කාර්යාලය වෙත අභ්‍යන්තර විගණන වාර්තාවන්හි පිටපත් ඉදිරිපත් කළ යුතු ය. මෙහිදී ජාතික විගණන පනතේ 38(1)(ඇ) අනුව සෑම ප්‍රධාන ගණන්දීමේ නිලධාරියෙකු/ ගණන්දීමේ නිලධාරියෙකු තම ආස්ථිතයේ ප්‍රමාණවත් හා ඵලදායී අභ්‍යන්තර පාලනයක් පවත්වාගෙන යන බවත්, කලින් කලට එකී අභ්‍යන්තර පාලන පද්ධති සමාලෝචනය කර අවශ්‍ය සංශෝධනයන් සිදු කරන බවටත් සහතික විය යුතු ය. ඒ අනුව එකී අවශ්‍යතාවය ද සපුරාලීමට හැකි වන පරිදි අභ්‍යන්තර විගණන වාර්තා පිළියෙල කිරීම සඳහා උපයෝගී කර ගත හැකි ආදර්ශ ආකෘතියක් **ඇමුණුම 09** මගින් දක්වා ඇත.

**iii.** විශේෂ විමර්ශන වාර්තා

තම ආයතන ප්‍රධානීන් විසින් අවශ්‍යතානුකූලව තමා වෙත සිදු කිරීමට පවරනු ලබන විශේෂ විමර්ශනයන් පිළිබඳ වාර්තා අභ්‍යන්තර විගණක විසින් ආයතන ප්‍රධානියා වෙත ඉදිරිපත් කළ යුතු ය.

**iv.** **ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ/ පළාත් අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂගේ/ අභ්‍යන්තර විගණකගේ කාර්තුමය ඇගයීම් වාර්තාව**

මෙම චක්‍රලේඛයේ **ඇමුණුම 10** ආකෘතිය භාවිත කරමින් පිළියෙල කරනු ලබන ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ/ පළාත් අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂගේ/ අභ්‍යන්තර විගණකගේ කාර්තු ඇගයීම් වාර්තාව සෑම කාර්තුවක් අවසන්ව එළඹෙන ඉදිරි මස ඇතුළත සකස් කර එහි මෘදු පිටපතක් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු ය. තව ද ඒ ඒ කාර්තුව අවසන් වූ පසුව ආයතනය තුළ පවත්වනු ලබන විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේ දී මෙම කාර්තු වාර්තාව මගින් අනාවරණය වන බැහැරවීම් සහ දුර්වලතා සාකච්ඡා කර විසඳීමට කටයුතු කළ යුතු ය. පළාත් සභා සම්බන්ධයෙන් වන විට ආයතන විශාල ප්‍රමාණයක් පවතින බැවින් පළාත්

අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂගේ කාර්තු ඇගයීම් වාර්තාව පිළියෙල කිරීමේදී සියලුම ආයතනවල තොරතුරු වෙන වෙනම ලබාගෙන පිළියෙල කිරීම ප්‍රායෝගිකව අපහසු වන බැවින් පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයේ සහ පළාත් සභාව යටතේ ඇති අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල තොරතුරු ඇතුලත් කරමින් මෙම වාර්තාව පිළියෙල කිරීම සුදුසුය.

## 07. චක්‍රලේඛය පිළිබඳ වැඩිදුර පැහැදිලි කර ගැනීම

මෙම චක්‍රලේඛය සම්බන්ධයෙන් වැඩිදුරටත් පැහැදිලි කිරීමක් අවශ්‍ය වන්නේ නම් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ දුරකතන අංක 0112484974 මගින් විමසීම් කළ හැකි ය.

කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද පහත සඳහන් චක්‍රලේඛ හා මාර්ගෝපදේශ මෙමගින් අවලංගු කරනු ලැබේ.

i. 2019.01.12. දිනැති කළමනාකරණ විගණන චක්‍රලේඛ අංක: DMA /01-2019
ii. 2019.05.21 දිනැති කළමනාකරණ විගණන චක්‍රලේඛ ලිපි අංක: DMA /01/2019/Letter
iii. 2020.08.26 දිනැති පළාත් අභ්‍යන්තර විගණන මාර්ගෝපදේශ අංක 01
iv. 2021.12.24 දිනැති කළමනාකරණ විගණන චක්‍රලේඛ අංක: DMA /01-2019(1)
v. අංක DMA/AMC/02/2021/02 හා 2021.04.05 දිනැති ලිපිය මගින් නිකුත් කළ අවදානම් පාදක අභ්‍යන්තර විගණන සැලැස්ම පිළියෙල කිරීම පිළිබඳ මග පෙන්වීම් ඇතුළත් කළමනාකරණ විගණන චක්‍රලේඛ ලිපි අංක DMA/01-2019/1
vi. 2023.01.23 දිනැති කළමනාකරණ විගණන මාර්ගෝපදේශ: DMA /01-2023
vii. 2023.02.09 දිනැති කළමනාකරණ විගණන මාර්ගෝපදේශ 02/2023
viii. 2023.07.25 දිනැති කළමනාකරණ විගණන චක්‍රලේඛ අංක: DMA /01-2019 ලිපි අංක 03

**(මෙම චක්‍රලේඛය මගින් කිසියම් පනතක, මුදල් රෙගුලාසියක හෝ පළාත් මූල්‍ය රීතියක ඇතුළත් විධිවිධාන සම්බන්ධව කරුණු දක්වා ඇති විට චක්‍රලේඛයේ කවර ආකාරයෙන් ඒ පිළිබඳව සඳහන් වුව ද අදාළ පනතේ, මුදල් රෙගුලාසියේ හෝ පළාත් මූල්‍ය රීතියේ සඳහන් විධි විධාන බලාත්මක වේ.)**

ජේ.කේ.සෙනෙවිරත්න
භාණ්ඩාගාර ලේකම්(වැ.බ.)

පිටපත් 1.ජනාධිපති ලේකම්
2.අග්‍රාමාත්‍ය ලේකම්
3.අමාත්‍ය මණ්ඩල ලේකම්
4. විගණකාධිපති

ඇමුණුම 01

<u>විගණන හා කළමනාකරණ කමිටු සංයුතිය</u>

**1.** අමාත්‍යාංශ විගණන හා කළමනාකරණ කමිටුවේ සංයුතිය

1. අමාත්‍යාංශ ලේකම් - සභාපති
2. අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරී - සාමාජික
3. කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ නියෝජිත - සාමාජික
4. ජාතික විගණන කාර්යාලයේ නියෝජිත - නිරීක්ෂක
5. අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක - කැඳවුම්කරු

**2.** දෙපාර්තමේන්තු විගණන හා කළමනාකරන කමිටුවේ සංයුතිය

**2.1** කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකු කමිටු සාමාජික ලෙස පත් කර ඇති විට

1. දෙපාර්තමේන්තු ප්‍රධානියා - සභාපති
2. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරී - සාමාජික
3. කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ නියෝජිත - සම සාමාජික
4. අදාළ අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක - සම සාමාජික
5. ජාතික විගණන කාර්යාලයේ නියෝජිත - නිරීක්ෂක
6. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අභ්‍යන්තර විගණක - කැඳවුම්කරු

**2.2** කළමනාකරන විගණන දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකු කමිටු සාමාජික ලෙස පත් කර නොමැති විට

1. දෙපාර්තමේන්තු ප්‍රධානියා - සභාපති
2. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරී - සාමාජික
3. අදාළ අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක - සාමාජික
4. ජාතික විගණක කාර්යාලයේ නියෝජිත - නිරීක්ෂක
5. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අභ්‍යන්තර විගණක - කැඳවුම්කරු

**3.** දිස්ත්‍රික් ලේකම් කාර්යාල විගණන හා කළමනාකරණ කමිටුවේ සංයුතිය

1. දිස්ත්‍රික් ලේකම් - සභාපති
2. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන ගණකාධිකාරී - සාමාජික
3. කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ නියෝජිත - සම සාමාජික

4. විෂය භාර අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක - සම සාමාජික

5. ජාතික විගණන කාර්යාලයේ නියෝජිත - නිරීක්ෂක

6. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක - කැඳවුම්කරු

4. පළාත් සභා විගණන හා කළමනාකරණ කමිටු සංයුතිය

i. පළාත් සභා විගණන හා කළමනාකරණ කමිටුව

1. ප්‍රධාන ලේකම් - සභාපති

2. නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුදල්) - සාමාජික

3. කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ නියෝජිත - සාමාජික

4. ජාතික විගණන කාර්යාලයේ නියෝජිත - නිරීක්ෂක

5. පළාත් අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ - කැඳවුම්කරු

ii. පළාත් සභාව යටතේ ඇති අමාත්‍යාංශ සඳහා වන විගණන හා කළමනාකරණ කමිටුව

1. අමාත්‍යාංශ ලේකම් - සභාපති

2. ප්‍රධාන ගණකාධිකාරී/ගණකාධිකාරී - සාමාජික

3. පළාත් භාණ්ඩාගාරයේ නියෝජිත - සාමාජික

4. පළාත් අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ හෝ නියෝජිතයෙකු - නිරීක්ෂක

5. ජාතික විගණන කාර්යාලයේ නියෝජිත - නිරීක්ෂක

6. අභ්‍යන්තර විගණන විෂය භාර මාණ්ඩලික නිලධාරී - කැඳවුම්කරු

iii. පළාත් දෙපාර්තමේන්තු සඳහා වන විගණන හා කළමනාකරණ කමිටුව

1. දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා - සභාපති

2. ප්‍රධාන ගණකාධිකාරී/ගණකාධිකාරී - සාමාජික

3. පළාත් භාණ්ඩාගාර නියෝජිතයෙකු - සම සාමාජික

4. අදාල පළාත් අමාත්‍යාංශයේ නියෝජිත - සම සාමාජික

5. පළාත් අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂගේ නියෝජිතයෙකු - නිරීක්ෂක

6. ජාතික විගණන කාර්යාලයේ නියෝජිත - නිරීක්ෂක

7. අභ්‍යන්තර විගණන විෂය භාර මාණ්ඩලික නිලධාරියා - කැඳවුම්කරු

ඇමුණුම 02

<u>විගණන හා කළමනාකරණ කමිටුවල නිර්දේශිත කාර්යභාරය</u>

ජාතික විගණන පනතේ 41(1) (අ) සහ (ආ) හි සඳහන් කාර්යයන්ට අමතරව පහත සඳහන් කාර්යයන් සම්බන්ධයෙන් ද විගණන හා කළමනාකරණ කමිටුව කටයුතු කළ යුතුය.

1. අභ්‍යන්තර විගණන ඒකකයේ විෂයපථය නිර්ණය කිරීම.

2. වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම පූර්ව විමසුමට භාජනය කර අනුමත කිරීම.

3. ආයතනයේ අවදානම් ලේඛණය මත පදනම්ව ආයතනයේ අභ්‍යන්තර විගණක විසින් ආයතනයේ අභ්‍යන්තර පාලන පද්ධතිය සමාලෝචනය, ඇගයීම හා ඒ අනුව අභ්‍යන්තර පාලන පද්ධති වැඩි දියුණු කිරීමට අදළව ලබාදෙන නිර්දේශ අධ්‍යනයකර කමිටුවේ නිර්දේශ ආයතනයේ අවදානම් කළමනාකරණ කමිටුව වෙත ඉදිරිපත් කිරීම.

4. විගණන විමසුම් මගින් පෙන්වා දී ඇති විෂමතාවයන් සම්බන්ධව කඩිනමින් කටයුතු කිරීම සඳහා වන නිර්දේශ ලබාදීම.

5. විගණන විමසුම් හා වාර්තා නිතිපතා සමාලෝචනය කිරීම හා විෂමතාවයන් යළි ඇතිවීම වළක්වාලීම පිණිස අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීම.

6. අයවැය සමාලෝචන වාර්තා ඇතුලු මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීම හා පිරිවැය සඵලතාවය, කාර්යසාධනය හා ඉලක්ක සාක්ෂාත් කර ගැනීම ඇගයීම.

7. වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සහ වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මෙන් අපේක්ෂිත කාර්ය සාධනයෙන් බැහැර වන විට ඒ සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා අවශ්‍ය නිර්දේශ ලබා දීම.

8. මූල්‍ය ප්‍රකාශන හා අනෙකුත් මාසික, කාර්තුමය, අර්ධ වාර්ෂික හා වාර්ෂික වාර්තා යනාදිය කාලීනව ඉදිරිපත් කිරීම පසුවිපරම් කිරීම.

9. භාණ්ඩාගාර/ පළාත් භාණ්ඩාගාර හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ හා වෙනත් නියෝග පිළිබඳ දැනුවත් කිරීම, ව්‍යවස්ථාපිත හා වෙනත් නීති රීති පිළිපැදීමේ අවශ්‍යතාවය පෙන්වා දීම.

10. සියලුම මානව හා අනෙකුත් සම්පත් පරිපාලනය, සංවර්ධනය කිරීමේ කටයුතු සමාලෝචනය කිරීම සහ තීරණ ගැනීම සඳහා වන නිර්දේශ ලබා දීම.

11. කාර්ය මණ්ඩල විනයට අදාළ කරුණු සමාලෝචනය කිරීම, නාස්තිය හා දූෂණය පිටුදැකීම සහ ආයතනයේ වියදම් අරපිරිමැස්ම කෙරෙහි අවධානය යොමු කරවීම.

12. රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාවේ/ පළාත් රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාවේ හා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ නියෝග ක්‍රියාත්මක කිරීම පිළිබඳව පසුවිපරම් කිරීම.

13. කමිටු නිර්දේශයන් මත පදනම් වූ ක්‍රියාකාරකම් අපේක්ෂිත පරිදි ඉටු කර ඇද්ද යන්න පසුවිපරම් කිරීම.

ඇමුණුම 03

<u>විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේ</u>

<u>ආදර්ශ න්‍යාය පත්‍රය</u>

**ආයතනය:- ......................................................................................................................................**

**වර්ෂය:...........................** **කාර්තුව:............................**
**දිනය:.......................................**

1. පිළිගැනීම, අරමුණු පැහැදිලි කිරීම හා පසුගිය රැස්වීම් වාර්තාව සම්මත කර ගැනීම.
2. පසුගිය රැස්වීම්වල දී ගනු ලැබූ තීරණවල ප්‍රගතිය විමසීම
3. රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාවේ/ පළාත් රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාවේ/ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය විමසීම.
4. අභ්‍යන්තර විගණනයෙන් හෙළිදරව් කළ අවදානම් සහිත, කමිටුවේ විශේෂ අවධානය යොමු කළ යුතු කරුණු සාකච්ඡා කිරීම.
5. විගණකාධිපති විගණන විමසුම්/ වාර්තාවලින් හෙළිදරව් කළ විශේෂිත කරුණු සාකච්ඡා කිරීම.
6. අභ්‍යන්තර විගණකගේ කාර්තුමය ඇගයීම් වාර්තාවේ සඳහන් කරුණු සාකච්ඡා කිරීම. (රැස්වීම් පැවැත්වෙන දිනට ආසන්නතම පෙර මාසය දක්වා ප්‍රගතිය ඉදිරිපත් කළ යුතු ය.)
7. පාලිත ආයතනවලට අදාළව අමාත්‍යාංශ/ පළාත් සහා විගණන හා කළමනාකරණ කමිටු මට්ටමෙන් විසඳා ගත යුතු කරුණු සාකච්ඡා කිරීම.
8. ඉහත න්‍යාය පත්‍රය මගින් සාකච්ඡා කළ කරුණුවලට පරිබාහිරව සම්බන්ධිත වෙනත් විගණන හා කළමනාකරණ කමිටුවලින් පැන නැගුණු කරුණු හා වෙනත් විශේෂ කරුණු පිළිබඳ සාකච්ඡාවක් අවශ්‍ය වේ නම් ඒ සඳහා අවස්ථාව ලබා දීම.
9. විගණන හා කළමනාකරන කමිටු සභාපතිට, සාමාජිකයින්ට හෝ නිරීක්ෂකයින්ට විශේෂ අදහස් දැක්වීමක් අවශ්‍ය අවස්ථාවලදී ඒ සඳහා අවස්ථාව ලබා දීම.

ඇමුණුම 04

<u>විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර්තාවක ආදර්ශ ආකෘතිය</u>

ආයතනයේ නම:- ..............................................................................

වර්ෂය හා කාර්තුව:- ..............................................

දිනය:- 20.......................

රැස්වීම ආරම්භ කරන ලද වෙලාව:- ........................................

කමිටුව

| නම | තනතුර (ඇමුණුම 01 ට අනුව අදාළ පරිදි ඇතුළත් කළ යුතුය) |
|---|---|
| ................................................ | ............................................ |
| ................................................ | ............................................ |
| ................................................ | ............................................ |
| ................................................ | ............................................ |
| ................................................ | ............................................ |

සහභාගිවූ වෙනත් නිලධාරීන්

| නම | තනතුර |
|---|---|
| ................................................ | ............................................ |
| ................................................ | ............................................ |
| ................................................ | ............................................ |

නොපැමිණි නිලධාරීන්

| නම | තනතුර |
|---|---|
| ................................................ | ............................................ |
| ................................................ | ............................................ |
| ................................................ | ............................................ |
| ................................................ | ............................................ |
| ................................................ | ............................................ |

01. පසුගිය රැස්වීම් වාර්තාව සංශෝධනයන් සහිතව/ රහිතව සහා සම්මත වූ බව

02. පසුගිය රැස්වීම්වල දී සාකච්ඡා කළ අවසන් තීරණයක් ලබා නොදුන් කරුණුවල ප්‍රගතිය

| අනු අංකය | කාරණය (අභ්‍යන්තර හා බාහිර විගණන විමසුම්වලට අදාළ වන අවස්ථාවලදී එහි යොමුව) | පෙර කමිටු රැස්වීම්වලදී ලබා දෙන ලද නිර්දේශ | ප්‍රගතිය | ප්‍රවර්තන කමිටු රැස්වීමේදී ලබාදුන් නිර්දේශ/ තීරණය සහ ක්‍රියාත්මක කර අවසන් කළ යුතු දිනය | වගකිව යුතු නිලධාරියා/ අනු කමිටුව | සාකච්ඡා කළ වාර ගණන |
|---|---|---|---|---|---|---|
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |

03. රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාවේ/ පළාත් රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාවේ/ රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරිමේ ප්‍රගතිය

